# අතුරු බෝග වගාව කුඩා රබර් ඉඩම් හිමියන් අතර ප්‍රචලිත කල හැකිද?

කිත්සිරි ඊ ජයසූරිය හා ලක්ෂ්මන් රොද්‍රිගෝ

හෙක්ටයාර් මිලියන 6.5 ක් වූ ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 196,000ක් පමණ රබර් වගාවෙන් සමන්විතව ඇත. එයින් 20%ක් පමණ ප්‍රමාණයක් (137300 හෙක්ටයාර්) සුළු ඉඩම් හිමියන් විසින් වගා කරනු ලැබේ. ඒ හා සරිලන පමණින් ලංකාවේ මුළු රබර් නිෂ්පාදනයටද ඔවුන් දායකවෙති. කෙසේ වෙතත් මෙම අංශයේ වර්ධනය ක්‍රමයෙන් හීන වෙමින් පවතින බැවින් ස්වාභාවික රබර් නිෂ්පාදනයට මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථිකයටද බලවත් ලෙස මෙය බලපා ඇත. මෙයට හේතුව ක්‍රමවත් සැලැස්මක් මත ඔවුන්ගේ ප්‍රශ්ණ පිළිබඳව සොයා බැලීමක් කර ඒවාට විසඳුම් නොයෙදීම විය හැකිය.

අවුරුදු 6ක් හෝ ඊට වැඩි කලක් වන රබර් වගාවේ අපරිනත අවධිය තුළ වෙනත් කිසිදු ආදායමක් එම භූමියෙන් නොලැබීම නිසා සුළු ඉඩම් හිමියන් ඉතාම අසරන තත්වයකට පත්වේ. මෙවැනි තත්වයක් මත රබර් තනි වගාවක් ලෙස වැවීමට වඩා බහු වගාවක් ලෙස වැවීම උචිත යැයි හැඟී ගියෙන් 1981 සිට, තනි වගාවක් ලෙස රබර් වැවිය යුතු යැයි එතෙක් තිබූ සම්මතය වෙනස් කර පාලිත තත්වය යටතේ අතුරු බෝග වගාව සඳහා අවසර දෙන ලදී. එබැවින් කෙටි කාලීන බෝග වශයෙන් කෙසෙල්, අන්නාසි, වැල් දොඩම් සහ එළවළුද දීර්ඝ කාලීන බෝග වශයෙන් කෝපි හා කොකෝවාද රබර් සමග අතුරු බෝගයක් ලෙස වගා කිරීමට රබර් පර්යේෂනායතනය මගින් නිර්දේශ කර ඇත. එනමුත් එම නිර්දේශ කවමක් ප්‍රයෝජනයට ගෙන ඇත්තේ කුඩා රබර් වතු හිමියන්ගෙන් සුලු කොටසකි.

කුඩා රබර් ඉඩම් හිමියන් රබර් සමග අතුරු බෝග වගාව කෙරෙහි දක්වන උදාසීනත්වය ගොවියාගේ සමාජ, ආර්ථික හා කාර්මික ගැටළු මනාව පිළිබිඹු කරන්නකි. ප්‍රමාණවත් දැනුමක් නොමැතිකම, ආයෝජන සඳහා මුදල් නොමැතිකම, අතුරු බෝග අලෙවිය සඳහා සුදුසු වෙළඳ පලක් නොමැති කම, පොහොර මිල අධික බව, ශ්‍රම සුබලතාවයේ ඇති ගැටළු. බෝග ආරක්ෂා කර ගැනීම හා සම්බන්ධ ප්‍රශ්න සමහරකි. අතුරු බෝග වගාව ප්‍රචලිත කිරීමේදී මේ සියලුම ගැටළු සඳහා විසඳුම් සෙවීම අවශ්‍ය වූවද මේ සඳහා දැනට පවතින ප්‍රධානම බාධක වන්නේ සුළු ඉඩම් හිමියන් සතු ප්‍රමානවත් නොවන දැනුම හා අතුරු බෝග අලෙවිය සඳහා සාර්ථක වෙළඳ පලක් නොමැති කමයි. උදාහරණයක් ලෙස, රබර් වගා කරන ප්‍රදේශ කවයක් අතරින් මෑතකදී

කරන ලද කෙටි සමීක්ෂණයක ප්‍රතිඵල දැක්විය හැකිය. එම සමීක්ෂණයට භාජනය කරන ලද කුඩා රබර් වතු හිමියන්ගෙන් 15% සිට 45% ක් දක්වා ප්‍රමාණයක් රබර් සමග අතුරු බෝග වගාව කරන බව පෙනී ගියේය. කෙටි කාලීන බෝග වගාව මෙහිදී ප්‍රධාන වී ඇත. මොවුන් වැඩි දෙනෙක් රබර් සඳහා යොදා ඇති පරතරය නම් මී3.7 X මී 6.1 (12' X20') වේ. ස්වල්ප දෙනෙක් මී2.4 X මී9.2 (30' X 8') යන පරතරය යොදා ඇත. රබර් පර්යේෂනායතනය අතුරු බෝග වගාවේදී රබර් සඳහා සුදුසු පරතරය ලෙස 30' X 8 නිර්දේශ කර ඇති මුත් (නව නිර්දේශය 27' X 8') සුළු ඉඩම් හිමියන් මේ සඳහා 12' X 20' යොදා ගැනීම, ඔවුන් ලබන ආදායම සීමා වීමට හේතු වී ඇත. රබර් පේළි අතර මෙවැනි කෙටි පරතරයක් යෙදීමෙන් කෙටි කාලයක් තුල දෙවන බෝගය වවන ප්‍රදේශය මත රබර් වගාව මඟින් සෙවන ඇති කිරීමත්, දෙවන බෝගය සඳහා ඉඩ කඩ මදි වීමත් මෙහිදී ප්‍රධාන බාධක ලෙස විස්තර කල හැකිය.

තවද සාර්ථක වෙළඳ පලක් පවතින කොළඹ හා ඒ ආසන්න ප්‍රදේශ වල අත්හැර දමා ඇති රබර් ඉඩම් පවා අතුරුබෝග වගාව සඳහා උනන්දුවක් දක්වන අය විසින් බද්දට ගෙන වගා කරනු ලැබේ. මෙය සුදුසු වෙළඳ පොලක් වගාවන් ආසන්නයේ තිබීමේ අවශ්‍යතාවය මනාව පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ හිටපු අධ්‍යක්ෂ ආචාර්ය ඒ. ද එස් ලියනගේ මහතාගේ අදහස් අනුව දැනට කුඩා රබර් ඉඩම හිමියන් අතරේ ක්‍රියාත්මක වන අනුවර්තන පර්යේෂණ ව්‍යාපෘතිය ඔවුන්ගේ ප්‍රශ්න කෙරෙහි විසඳුම් සෙවීම අටියෙන් සැලසුම් කරන ලද්දකි. ශ්‍රී ලංකා රබර් පර්යේෂනායතනයත්, රබර් උපදේශක සේවා දෙපාර්තමේන්තුවත් ඒකාබද්ධව ලෝක බැංකුවේ ආධාරයෙන් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරනු ලබයි. මෙතෙක් රජයේ වතු අංශයට සීමාවූ පර්යේෂන සුළු ඉඩම් තුලද පැවැත්වීමෙන්, දැනට රබර් පර්යේෂණායතනය මගින් කර ඇති නිර්දේශයන් කොතෙක් දුරට හා කෙලෙස සුළු ඉඩම් හිමියන් අතරේ ක්‍රියාත්මක වන්නේ දැයි අධ්‍යයනය කිරීමක් මෙම ව්‍යාපෘතියේදී සිදු කෙරේ. අතුරු බෝග වගාවට මෙහිදී ප්‍රධාන තැනක් හිමිවී ඇත, අදාල අතුරු බෝගයන්ගේ රෝපන ද්‍රව්‍ය, රබර් පැල සහ පොහොර දිරි ගැන්වීමක් වශයෙන් ගොවීන්ට නොමිලේ ලබාදෙන අතර අනෙකුත් නඩත්තු කටයුතු සහ වියදම් ඔවුන් විසින්ම කල යුතුව ඇත. වගා නඩත්තු වියදම් පිලිබඳව ක්‍රමානුකූලව දත්ත සටහන් කිරීමක්ද ඔවුන් වෙතින් අවශ්‍යවේ. පහත සඳහන් ආකාරයට අතුරු බෝග වගාවන් පර්යේෂණ වැඩසටහන යටතේ යොදන ලදී. මෙහිදී සංසන්දනය කිරීම සඳහා අතුරු බෝග රහිත වගාවන්ද උපයෝගී කරගන්නා ලදී.

## අනුවර්තන පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ යොදන ලද ප්‍රතිකාරක

### අක්. 1.5 ට අඩු ඉඩම් සඳහා

| ක්ලෝන | | | පැල වර්ග සහ සිටවූ ආකාරය |
|---|---|---|---|
| 1. ආර් ආර් අයිසී | 100 | 12'X8' | බද්ධ පැල |
| 2. පීබී 86 | | 9'X22' | බද්ධ පැල අතුරු බෝග සමග |
| 2ඒ පීබී 86 | | 9'X22' | බද්ධ පැල |
| 3. පීබී 86 | | 12'X18' | බද්ධ පැල |
| 3ඒ පීබී 86 | | 11'X18' | බද්ධ පැල |
| 4. පීබී 86 | | 14'X14' | බද්ධ පැල |
| 5. ආර් ආර් අයිසී | 100 | 12'X18' | පොලිතීන් මලුවල සිටවූ බද්ධ පැල |
| 6. ආර් ආර් අයිසී | 100 | 8'X27' | පොලිතීන් මලුවල සිටවූ බද්ධ පැල අතුරු බෝග සමග |
| 7. පීබී 86 | | 11'X18' | ලපටි බද්ධ පැල50% පොලිතීන් මලු වල සිටවූ බද්ධ පැල 50% |
| 7ඒ ආර් ආර් අයිසී | 100 | 8'X27' | ලපටි බද්ධ පැල අතුරු බෝග සමග 50% හා පොලිතීන් මලුවල සිටවූ පැල අතුරු බෝග සමග 50% |

### අක්. 1.5—4 දක්වා

| | | | |
|---|---|---|---|
| 8. ආර් ආර් අයිසී | 100 | 8'X27' | පොලිතීන් මලු පැල 50% බද්ධ පැල 50% (සෑම කොටසකින්ම භාගයක් අතුරු බෝග සමග වගා කර ඇත.) |
| 9. ආර් ආර් අයිසී | 100 | 12'X18' | පොලිතීන් මලුවල සිටවූ පැල 50% බද්ධ පැල 50% |
| 10. ආර් ආර් අයිසී | 100/102/121 | 12'X18' | බද්ධ පැල |
| 11. ආර් ආර් අයිසී | 100/102/121 | 8'X27' | බද්ධ පැල අතුරු බෝග සමග |
| 12. ආර් ආර් අයිසී | 100/පීබී 86 | 12'X18' 1 | ලපටි බද්ධ පැල/පොලිතීන් මලුවල සිටවූ පැල/බද්ධ පැල |
| 13. ආර් ආර් අයිසී | 102 | 8'X27' | බද්ධ පැල අතුරු බෝග සමග |
| 14. ආර් ආර් අයිසී | 102 | 12'X18' | බද්ධ පැල |

1990 වර්ෂය සඳහා වූ අනුවර්තන පර්යේෂණ වැඩ සටහන සැලසුම් කිරීමේදී අතුරු බෝග වගාව සඳහා ඒ ඒ ප්‍රදේශ තුල පවතින ඒ ඒ බෝගයන් සඳහා වූ ඉල්ලුම සහ අදල බෝග පිලිබඳ ගොවියා සතු දැනුම සහ කැමැත්ත යන කරුනු සලකා බලන ලදී. එක් එක් දිස්ත්‍රික්කය සඳහා විවිධ බෝග මිශ්‍රන අඩංගු කුඩා ඉඩම් දෙක බැගින් ආරම්භ කිරීමට තීරනය කරන ලදී.

කෙසේ වෙතත් සුළු ඉඩම් හිමියා වගාව කෙරෙහි දක්වන ප්‍රතිචාරය මෙහිලා ඉතා වැදගත් තැනක් ගනී. මෙම පර්යේෂන ව්‍යාපෘතියේ ප්‍රථම අදියරෙන් පැහැදිලි වන එක් කරුනක් නම් සමහර ගොවීන් තුල වගාව ආරම්භයේ ඔවුන්

තුළ වගාව කෙරෙහි තිබූ උද්යෝගය ක්‍රමයෙන් හීන වී යන බවය. සමාජ හා ආර්ථික ප්‍රශ්න, අහිතකර කාලගුනික තත්වයන් මෙයට හේතු වශයෙන් දැක්විය හැකිය. එබැවින් මෙම ගැටළු සඳහා වඩාත් ඵලදායී විසඳුම් සෙවිය යුතුව ඇත. අතුරු බෝග වගාවෙන් ඉතා කෙටි කාලයකදී ආදායම් ලබාගත හැකි මාර්ග ඇත්නම් එම ආදායම් මගින් ඔවුනට තව තවත් එය කෙරෙහි නැඹුරු වීමට අවස්ථාව හා උද්යෝගය ලැබේ. අන්නාසි, කෙසෙල් හා එලවළු වැනි අතුරු බෝග වගාවන් ගොවීන් අතර වඩාත් ප්‍රචලිත වීමට හේතුව මෙම කරුන විය හැකිය.

මේ අතර, ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය මගින් රාජ්‍ය වතු අංශයේ පවත්වාගෙන යනු ලබන රබර් සමග තේ අතුරු බෝගයක් ලෙස වගා කිරීම දැනට යම් මට්ටමකින් සාර්ථක ප්‍රතිඵල ලබා තිබේ. එහෙත් ඒ පිළිබඳ වැඩිපුර අධ්‍යනය කිරීම අත්‍යාවශ්‍යය. මක්නිසාද යත් දීර්ඝ කාලීනව ගත්කල මෙම බෝග දෙක අතර යම් යම් අන්තර් බලපෑම් ඇතිවිය හැකි වීමයි. මෙහිදී තේ ගස පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වේ. එහි රසය හා සුවඳ ලබාදෙන රසායනික සංයෝගවල සංයුතිය කෙරෙහි රබර් ගසේ සෙවන සහ අනෙකුත් සාධක බලපෑමට ඉඩ ඇත. ඊට අමතරව එම ශාක දෙකෙහි මුල් පද්ධති අතර පාංශු පෝෂණ ද්‍රව්‍ය සඳහා ඇතිවිය හැකි තරඟය ගැනද අවධානය යොමුකල යුතුය. කරුණු කෙසේ වෙතත් යථා කාලයේදී කුඩා රබර් ඉඩම් හිමියාටද අක්කරයක් වැනි සුළු ඉඩමක රබර් සමග තේ වගාව අත්හදා බැලීමට අවස්ථාව උදාවනු ඇත. මේ සඳහා රබර් පර්යේෂණායතනයේ අනුග්‍රහය ඇතිව රබර් පාලන දෙපාර්තමේන්තුව මගින් නියාමක වැඩ සටහනක් දියත්කර ඇත. මෙම නියාමක වැඩ සටහනේදී රබර් සඳහා යෝග්‍ය පරතරය 8'X 40' වන අතර රබර් පේළි දෙක අතර 2' X 4' පරතරයක් ඇතිව තේ පේළි හතක් යොදා ගනු ලැබේ. රබර් හා තේ පේළි අතර පරතරය අඩි 8 ක් වේ. මෙම තත්ව යටතේ අක්කරයක වගා කල හැකි පැල ප්‍රමාණය පදනම් කරගෙන තේ මෙන්ම රබර් සඳහා ද, සහනාධාර ගෙවීමට අදහස් කෙරේ. මෙම වැඩසටහනට සහභාගී වන ගොවීන්ට තේ සඳහා මුළු සහනාධාරයෙන් 75% ක් ද, රබර් සඳහා 70% ක් ද බලාපොරොත්තු විය හැකිය. මෙම ව්‍යාපෘතිය සාර්ථක එකක් වුවහොත් රබර් සමග තේ වගාව කුඩා ඉඩම් හිමියා අතර ඉතා සීඝ්‍රයෙන් ජනප්‍රිය වීමට බොහෝ ඉඩ ප්‍රස්ථා ඇත. මක්නිසාද යත් මෙවැනි මිශ්‍ර වගාවක දී ඕනෑම කාලගුනික තත්වයක් යටතේ වුවද ආදායම් ලැබීමට හැකියාවක් ඇති බැවිනි.

භූමියේ සීමාකාරී බවත් එහි අගය නිරතුරුවම ඉහල යාමත් සැලකිල්ලට ගත් කල එක් භෝගයක් පමනක් වැවීමෙන් ලබන ආදායම ආර්ථිකමය අතින් එතරම් සාර්ථක එකක් නොවන බව පෙනී ගොස් ඇත. ඒකීය කාලයකදී ඒකීය ක්ෂේත්‍රයකින් වැඩි පලදාවක් ලැබීම තේමාව කරගත් බහු බෝග වගාව එක් විසඳුමක්වේ. අනිකුත් බෝග වර්ග සඳහා මෙන්ම රබර් සඳහා ද මෙම වගා රටාව උපයෝගී කරගනු ලැබේ. රබර් සමග වෙනත් එක් බෝගයක් වගා කිරීමට වඩා බෝග කීපයක් වගා කිරීමට ද හැකි බවට සාධක ඇත. එබැවින් අනාගතයේදී බෝග මිශ්‍රණ වශයෙන් විවිධ බෝග රටා යෙදීමට ඉතා හොඳ නැඹුරුවක් ඇත. මෙය, වඩාත් කාර්‍යක්ෂමව භූමිය හා කාලය ප්‍රයෝජනයට ගැනීමකි. රබර් පේළි අතර කෙසෙල් සමගින් ඉඟුරු හෝ කහ වගා කිරීමක් මෙහිදී උදාහරනයක් ලෙස දැක්විය හැකිය. එලෙසම අතුරු බෝගයක් වෙනුවට එම භූමියේම

පොලිතින් මලුවල සිටවූ රබර් පැල තවාන් සඳහා යොදා ගැනීමට අවශ්‍ය පරිදි ඉඩ සැලසීමද ඉතා ඵලදායී වීමට පුළුවනි. මීට අමතරව පරිනත රබර් වගාවන් තුල ඇන්තූරියම්, ඕකිඩ් හා අනෙකුත් සෙවන අවැසි උද්‍යාන ශාක වැවීමද ආර්ථීකමය අතින් ඉතා හොඳ ප්‍රතිඵල ලබා දීමක් විය හැකිය. ඉතා හොඳ ආදායමක් ලබාදෙන සත්ව පාලනය වැනි ව්‍යාපාරයක් වුවද මෙහිදී ආරම්භ කල හැකිය. ගව, බැටළු, මීමැසි පාලනය හා මස් පිනිය සීඝ්‍රයෙන් බෝවන හාවුන් වර්ග ඇති කිරීමද නීදසුන් වශයෙන් දැක්විය හැකිය.

ස්වයං රැකියා මගින් එක් එක් ජන කොටස් වල ජීවන තත්වය ඉහල නැංවීම ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉතා බැරෑරුම තත්වයක පවතින මෙවන් අවධියක ඉතා වැදගත්මෙන්ම අවශ්‍ය කර්තව්‍යයකි. ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉතා දීර්ඝ කාලයක සිට කෘෂිකාර්මික පසුබිමක් මත පදනම්වූ අපගේ ජීවන රටාව විදේශ ජාතික බලපෑම් වලින් පසුව ක්‍රමයෙන් කාර්මීකරනයට හසුවී ඇත. බොහෝවිට පාරම්පරිකව කෘෂිකර්මාන්තයට හවුල් වී සිටින සමහර ජන කොටස්ද තම ජීවන රටාව වෙනස් කරමින් කෘෂිකර්මාතයෙන් ඇත්වී නාගරය දෙසට යොමුවී ඇත. මෙම තත්වය වලක්වාලීමට රජය මගින් දැනට වැඩසටහන් කීපයක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර ඇත. ඊට අමතරවද, කෘෂිකර්මාන්තයට සම්බන්ධවී සිටින ජන කොටස් තුල ඇති ප්‍රශ්න නිරාකරනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමුකර ස්වයං රැකියා ලෙස රබර් සහ අනෙකුත් අපනයන බෝග වගාව දියුණු කිරීමට අතහිත දීමට හා ඒ සම්බන්ධයෙන් ගොවීන් තව තවත් උනන්දු කිරීමට පියවර ගතහැකි වෙනොත් එය ශ්‍රී ලංකාවේ ආර්ථිකය නංවාලීමේ බාරදූර කාර්යයට ඉතා හොඳ රැකුලක් වනු ඇත.